මැතිවරණ කොමිෂන් සභාව
தேர்தல் ஆணைக்குழு
Election Commission
මැතිවරණ මහලේකම් කාර්යාලය, අංක 02 සරණ මාවත, රාජගිරිය, ශ්‍රී ලංකාව
தேர்தல்கள் செயலகம், இல.02 சரண மாவத்தை, இராஜகிரிய, இலங்கை
Elections Secretariat, No.02 Sarana Mawatha, Rajagiriya, Sri Lanka

මාධ්‍ය නිවේදනය
ஊடக அறிவித்தல்
MEDIA RELEASE

LAE\2023\42

2023.03.07

**(262 වන අධිකාරය වූ) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥා පනතේ 38 (3) උප වගන්තිය යටතේ වූ නියමය**

(262 වන අධිකාරය වූ) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥා පනතේ (සංශෝධිත)38(1) (ඇ) වගන්තිය යටතේ එක් එක් දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරීන් විසින් පළ කරන ලද අංක 2317/02 සිට 2317/26 දක්වා හා 2023.01.30 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිවිශේෂ ගැසට් පත්‍රයේ සඳහන් කළ පරිදි හා එහි උපලේඛනයේ සඳහන් පළාත් පාලන ආයතන සඳහා වූ ඡන්ද විමසීම 2023 මාර්තු මස 09 දින නොපැවැත් වේ.

ඡන්ද පත්‍රිකා මුද්‍රණ කටයුතු හා ඡන්ද විමසීම් සම්බන්ධ සෙසු පහසුකම් සම්බන්ධයෙන් පැනනැඟුණු අනපේක්ෂිත හා නොවැළැක්විය හැකි කරුණු හේතුකොට ගෙන එකී ඡන්ද විමසීම 2023.03.09 දිනයෙහි පැවැත්වීමට නොහැකි බව හා ඒ සඳහා අප්‍රේල් මස 25 දිනය වඩා සුදුසු වන බව ද මැතිවරණ කොමිෂන් සභාව විසින් දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරීන්ට උපදෙස් ලබා දී ඇත.

(262 වන අධිකාරය වූ) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥා පනතේ (සංශෝධිත)38(1) (ඇ) උපවගන්තිය සමග කියවිය යුතු, එම ආඥා පනතේ 38(3) උපවගන්තිය යටතේ එකී පළාත් පාලන ආයතනවලට අදාළ නව ඡන්ද විමසීමේ දිනය වශයෙන් 2023 අප්‍රේල් මස 25 දිනය එක් එක් දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරීන් විසින් නිවේදනය කරනු ලබනු ඇත.

මැතිවරණ කොමිෂන් සභාවේ නියමය පරිදි,

සමන් ශ්‍රී රත්නායක
මැතිවරණ කොමසාරිස් ජනරාල්